**සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව - 2019/ 2020**

---

සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවේ ("සමාගම") 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තිත්වයක් විසින්ම එම අස්තිත්ව සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්තිත්වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්තිත්වවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්තිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 අප්‍රේල් 01 දින සිට 2020 මාර්තු 31 දින දක්වා වූ වර්ෂ හතරකට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(i) 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අය විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

**2.1 නොවිසඳුන විගණන ජේද**

---

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2016 අප්‍රේල් 01 සිට 2019 මාර්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව මා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද වාර්තාවේ 2.1 ජේදය යටතේ ඇතුළත් වූ පහත සඳහන් විගණන නිරීක්ෂණ සම්බන්ධව නිසි පියවර ගෙන නොතිබුණි.

## 3. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය කටයුතු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 ජූලි 01 දිනැති අංක පීඊ/ජීඔසීඔ/ටීආර්9 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් වසරක කාල සීමාවක් සඳහා පත්කළ නිසි බලධාරියා සමාලෝචිත වර්ෂයේද පත්වීම දීර්ඝ කර නොගෙන හා ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳව ලිඛිතව රාජකාරී පැවරුමක් නොමැතිව කටයුතු කර තිබුණි. | නිසිබලධාරි පත්වීම විධිමත් කිරීමට කටයුතු කරමින් පවතී. | නිසි බලධාරීගේ වසරක ධූර කාලය ඉකුත් වී ඇති බැවින් වහාම එම තනතුරු දැරීම නීත්‍යානුකූල කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තශාලා ඇති කර කුඩා රබර් වතු හිමියන්ට සහන සැලසීම සඳහා 1999 වර්ෂයේදී හා 2001 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් මෙම සමාගමට ලබාදී තිබූ උප ණය මුදලින් 2019 සැප්තැම්බර් 30 දින වන විට රු. මිලියන 773.34 ක් එදිනට උපචිත පොළිය රු. මිලියන 612.80 ක් අයවීමට ඇති බව භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් 2019 ඔක්තෝබර් 07 දින අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කර තිබුණි. එසේම එම ණය මුදල් පියවීමට ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව සුදුසු ආයෝජකයෙකුට බදුදීමටත් එහි යන්ත්‍ර සූත්‍ර අලෙවි කිරීමටත් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් උපදෙස් දී ඇතත්, එම උපදෙස් ක්‍රියාත්මක කර ඉහත උප ණය පියවීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් සුදුසු ආයෝජකයකුට බදු දීමට අමාත්‍ය මණ්ඩලය තීරණයක් ගෙන ඇත. ඒ අනුව තක්සේරුකරු විසින් තක්සේරු වාර්තා ගොඩනැගිල්ලට පමණක් ලබා දී ඇත. යන්ත්‍ර සූත්‍ර සඳහා තක්සේරු වාර්තා ලබා දිය නොහැකි බව දන්වා ඇත. එබැවින් එම තක්සේරු වාර්තාව කමිටුවක් මගින් ලබා ගැනීමට කටයුතු කර ඇත. එය ලද පසු යන්ත්‍ර සූත්‍ර ටෙන්ඩර් පටිපාටියට අනුව විකුණා හා තක්සේරු මුදලට ගොඩනැගිල්ල සහිත ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත ලබා දීමට ක්‍රියාකරනු ලැබේ. ඉන් ලබන ආදායම භාණ්ඩාගාරයට ලබාදීමට කටයුතු කරනු ලැබේ. | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් සමාලෝචනය

2010 අප්‍රේල් 30 දිනැති අංක 1651/20 දරන ගැසට් පත්‍රයෙන් සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කර තිබියදී සංස්ථාව සතු කර්මාන්තශාලා 06 න් මාවනැල්ල කේන්ද්‍ර අපසාරී, මාවනැල්ල ටයර් ටියුබ් හා බඳුරලිය ක්‍රේප් රබර් යන කර්මාන්තශාලා රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව මගින් හා වහරක ක්‍රේප් රබර් කර්මාන්තශාලාව සී/ස රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව මගින් පෞද්ගලික අංශය වෙත බදු පදනම මත ලබාදී තිබූ අතර, සිල්වඩෙල් කර්මාන්තශාලාව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරූ බව සඳහන් වුවද ඒ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම ඇල්පිටිය කර්මාන්ත ශාලාව වසර 11 ක සිට නිශ්කාර්යයව පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාවනැල්ල කේන්ද්‍ර අපසාරි, මාවනැල්ල ටයර් ටියුබ් හා බදුරලිය ක්‍රේප් රබර් යන කර්මාන්තශාලා බදුදීමට අදාළ බදු ගිවිසුම්වල බදු කොන්දේසි අංක **05** හි සඳහන් පරිදි බදු කාල සීමාව ආරම්භයේ සිට සෑම අවුරුදු **05** කට වරක් බදු වාරිකය සියයට **50** කින් වැඩි කළ යුතු විය. ඒ අනුව පළමු අවුරුදු පහ **2017** මාර්තු **12** දිනෙන් අවසන් වී තිබූ නමුත්, ගිවිසුම් ප්‍රකාරව බදු වාරිකය වැඩි නොකිරීම නිසා **2020** මාර්තු **31** දින මාස **36** යි දින **19** ක් සඳහා එම කර්මාන්ත ශාලා තුනෙන් රු. **11,033,847** ක් අඩුවෙන් බදුකුලිය අයකරගෙන තිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ. | හිග බදු කුලිය අය කර ගැනීම සඳහා ක්‍රියා කලයුත්තේ රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට බැවින් එම ආයතනය වෙත මේ පිළිබඳ දැන්වීමට ක්‍රියා කරමි. | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | "ඇරෝමා" නැමති පෞද්ගලික සමාගම වෙත බදු දී තිබූ මාවනැල්ල පිහිටි කේන්ද්‍ර අපසාරි/ කුට්ටි රබර් කර්මාන්තශාලාවේ බදු ගිවිසුමේ **5** වන වගන්තියේ බදු ගැණුම්කරුගේ කොන්දේසි ප්‍රකාරව **(xi)** කොන්දේසිය ප්‍රකාර බදු ගැනුම්කරු විසින් ගොඩනැගිලි හා අනෙකුත් ස්ථිර ඉදිකිරීම්ද ඇතුළුව සියලු අවදානම් සඳහා රක්ෂණය කළ යුතු නමුත්, එසේ කර නොතිබීම හා වත්කම් නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා , | | |
| **(i)** | එම කර්මාන්ත ශාලාවේ ප්‍රධාන ගොඩනැගිලි වහලය කඩා වැටී මේ වන විට වසර **02** කට අධික කාලයක් ගත වී ඇතත් එම වහලය නැවත ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. | මේ පිළිබඳව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් වෙතින් වියදම් ඇස්තමේන්තු ලබා ගැනීමට කටයුතු කරන ලද නමුත් ඇස්තමේන්තු වටිනාකම ඉහළ බැවින් **2020** වර්ෂයේ ඒ සඳහා ප්‍රතිපාදනසලසා ගැනීමට නොහැකි විය. | බදු ගිවිසුම ප්‍රකාරව කර්මාන්තශාලාව හානිවීම ප්‍රතිපූර්ණය කිරීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. |
| **(ii)** | ගොඩනැගිලි වහලය කඩා වැටීම සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | පූර්ණ පරීක්ෂණයක් සිදු කිරීමට සටහන් කර ගතිමි. | හානියට අදාල පූර්ණ පරීක්ෂණයක් කළ යුතුය. |
| **(iii)** | වහලය කඩා වැටුන **2018** ජූලි සිට **2020** මාර්තු **31** දින වන විටත් මෙම කර්මාන්තශාලාවෙන් අයවිය යුතු රු.**13,856,787** ක් (රු.**659,847***මාස **21**) වූ බදු මුදල් අයකරගෙන නොතිබුණි. | අදාල බදු මුදල් අයකර ගැනීමට රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත දැන්වීමට ක්‍රියා කරමි. | ගිවිසුම් ප්‍රකාරව බදු කුලී අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාගම සතු කර්මාන්තශාලා තුනක් බදු දෙනු ලබන අවස්ථාවේ බදු ගැනුම්කරුවන්ට භාරදුන් වත්කම් පිළිබඳ ලැයිස්තු විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා එම අවස්ථාවේ දී තිබූ වත්කම් පොත්වලින් ඉවත් කර තිබේද යන්න තහවුරු කර ගැනීමට නොහැකිව ඇත. | රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට බදු දෙන අවස්ථාවේදී සියළුම වත්කම් වාර්තා ඔහු විසින් ලබා දුන් බව නිසි බලධාරි විසින් වාර්තා කර ඇත. | නිවැරදි තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |